
විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - 04
විමලසේන සර් - 2021. 10. 17
**(12.30 – 3.30)**

# විෂය මාලාවේ මනෝ විද්‍යාත්මක පදනම



මනෝ විද්‍යාත්මක ගුරුකුල -

1. චර්යාවාදය
2. ප්‍රජානනවාදය
3. මානවවාදය
4. ස්වනිර්මාණවාදය

# මනෝ විද්‍යාත්මක ගුරුකුළ

- **චර්යාවාදී න්‍යාය**
- **ප්‍රජානනවාදී න්‍යාය**
- **මානවවාදී න්‍යාය**
- **ස්වනිර්මාණවාදී න්‍යාය**

## චර්යාවාදය

චර්යාවාදී ඉගෙනීම පිළිබඳ අධ්‍යයනයන් ආරම්භ වන්නේ පුද්ගලයාගේ චර්යා නිරීක්ෂණයෙනි. මේ නිසා චර්යාවාදී ප්‍රවේශය පිළිගන්නා පුද්ගලයන් උනන්දුව දක්වන්නේ දරුවෙකු නියම වශයෙන් කරන ක්‍රියාවන් පිළිබඳවය. චර්යාවන් නිරීක්ෂණය කිරීමට හැකි නිසා චර්යාව නිරීක්ෂණය වඩාත් වාසිදායක බව ඔවුන් සිතුහ. ඔවුන්ගේ මතය වූයේ ආවෘත නැතහොත් සැගවී ඇති මූලික වශයෙන් පෞද්ගලික, මානසික ලෝකය අධ්‍යයනය කිරීම දුෂ්කර බවයි.

චර්යාවාදීන්ගේ මතයට අනුව මනුෂ්‍ය හා සත්ව හැසිරීම් යම් ප්‍රබෝධයකට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිඵලයක් නිසා ඇතිවෙන්නක් බව කියයි. මෙය මානව චර්යාව පරිසරාත්මක බලපෑම් වල කෘත්‍යයක් ලෙස සලකති.

මෙහි පරිසරය යන්නට සමාජීය හා භෞතික යන අංශ දෙකම අදාළ වේ. බොහෝ දුරට චර්යාවාදීන් සෑම චර්යාවක්ම උගත් ඒවා ලෙස සලකති. මෙය සිදු වන්නේ යම් පුද්ගලයෙකු පරිසරය සමඟ ඇති කර ගන්නා අන්තර් ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ඉගෙනීම, චර්යාත්මක වෙනසක් බව පැහැදිළි කරයි.

ඒ අනුව ඉගෙනීම සිදුවන ආකාරය පිළිබඳව චර්යාවාදීන් ඉගෙනීම් න්‍යායන් තුනක් ඉදිරිපත් කරයි. ඒවා නම්,

I. සම්භාව්‍ය ආරෝපණ න්‍යාය
II. ප්‍රකාරක ආරෝපණ න්‍යාය
III. සමාජ ඉගෙනීම් න්‍යාය

යනුවෙනි.

**<u>සම්භාව්‍ය ආරෝපණ න්‍යාය</u>**

මෙම න්‍යාය මුලින්ම ඉදිරිපත් කරන ලද්දේ රුසියානු ජාතික ජීව විද්‍යාඥයෙකු වූ **<u>අයිවන් පැවුලෝයි</u>** ඔහු බල්ලෙකු සමග සම්බන්ධ කරගත් පර්යේෂණයක් ආශ්‍රයෙන් ඉගෙනීම පිළිබද න්‍යායක් ඉදිරිපත් කරන ලදී. සම්භාව්‍ය ආරෝපණ න්‍යාය මගින් චර්යා වෙනස් වීම විස්තර කරන්නේ ඉතා

සරල ආකාරයටය. මෙම න්‍යාය මගින් ජීවීන්ගේ ඉගෙනීම පිළිබඳ විස්තර කිරීමට යොදා ගෙන ඇත. අප උගන්නා බෙහෝ දේ සම්භව්‍ය ආරෝපණ න්‍යායට අනුව සිදුවේ.

**ප්‍රකාරක ආරෝපණ න්‍යාය**

මෙම න්‍යාය ඉදිරිපත් කරන ලද්දේ බී. එෆ්. ස්කිනර් නැමැත්තාය. ඔහු පර්යේෂණයක් මගින් පැහැදිළි කරන්නේ සියලු චර්යාවන්, එම චර්යාවන්ගේ ප්‍රතිඵලය මගින් පාලනය වන බවයි. ප්‍රතිඵලය යන්වෙන් අදහස් කළේ චර්යාවක් අවසානයේදී පුද්ගලයාට අද්දැකීමට සිදුවන දේය. මේ නිසා ඔහු චර්යාවකට පසුව කිසියම් ආකාරයක ප්‍රථිඵල අද්විදීමට සැලැස්වීමෙන් හෝ චර්යාවකට පසුව කිසියම් ආකාරයක ප්‍රතිඵල ඉවත් කිරීමෙන් ඉගෙනීමක් සිදුවන බව ස්කිනර් පෙන්වා දුන්නේය. එය පැහැදිළිව කිවහොත් ඉගෙනීම ප්‍රතිචාර හා ප්‍රතිඵලය සම්බන්ධතාවයක් ලෙස පැහැදිළි කරයි.

**සමාජ ඉගෙනුම් න්‍යාය**

ඇමරිකානු මනෝ විද්‍යාඥයෙකු වූ **ඇල්බට් බන්ධුරා** සහනව චරියාවාදීන් විසින් මෙම න්‍යාය ඉදිරිපත් කරන ලදී. මෙම න්‍යාය චර්යාවාදී හා ප්‍රජානනවාදී න්‍යායන් දෙකෙහිම සංකලනයකි. ඔහු මෙම න්‍යාය ඉදිරිපත් කිරීම සදහා පර්යේෂණය කරන ලද්දේ ළදරු පාසලක දරුවන්ය. ඔහු විසින් දරුවන් කාණ්ඩ 05 කට වෙන්කර පහත පර්යේෂණ අවස්ථා 05 ට යොමු කරන ලදී. ඒ අනුව,

1. ප්‍රමාණයේ පුද්ගලයෙක් තවත් එවැනිම පුද්ගලයෙකුට පහර දෙනු ලබන පින්තූරයක් නැරඹීමට සැලැස්වීය.
2. එයම චිත්‍රපටියකින් නැරඹීමට සැලැස්විය.
3. එයම කාටුන් රූප ලෙස නැරඹීමට සැලැස්වීය.
4. මෙම කණ්ඩායමට කිසිවක් නොපෙන්වන ලදී (පාලිත)
5. චිත්තවේගී හැඟීම් සහිතව ඉහත දර්ශන නැරඹීමට සැලැස්වීය.

ළමා කණ්ඩායම් 5 ඉහත අවස්ථා 5 ට මුහුණ දීමෙන් අනතුරුව එම අවස්ථාවට සමාන සැබෑ අවස්ථාවන්ටමුහුණ පෑමට සැළැස්වීය.

මෙහිදී පාලිත කණ්ඩායම (4) හැර අනෙක් කණ්ඩායම් වල අය එය දැක ආක්‍රමණශීලි ප්‍රතිචාර දැක්වීය. චිත්තවේගී හැගීම් සහිතව දුටු (5) කණ්ඩායම, පාලිත (4) කණ්ඩායමටත් වඩා අඩු ආක්‍රමණශීලි ලක්ෂණ දැක්වීය. බන්ධුරා මෙයින් ඔප්පු කරන ලද්දේ පඞන්ඩත්ව හැසිරීමේ චර්යාව දුටු අයගේ එවැනි හැසිරීම් වැඩි වූ බවය. ඒ අනුව,

මෙම පර්යේෂණ ඇසුරින් සමාජ ඉගෙනුම් න්‍යාය පෙන්වාදෙන්නේ අන්‍ය පුද්ගලයන්ගේ චර්යාව ඇසුරින් දකින අය ඒවා අනුකරණය කරනු ලබන බවයි. කොටින්ම ළමයින් ගෙදර දෙමාපියන් අහල පහළ පරිසරයේ පුද්ගලයන් හෝ තමන් දකින චරිත නිරීක්ෂණය කොට ඉගෙනුම ලබයි. පාසල්වල ළමයින් නිවසේ ක්‍රීඩා කරන විට තම ගුරුතුමිය අනුකරණය කිරීම, සෙල්ලම් කඩ, සෙල්ලම්

ගෙවල්, ඇතැම් විට ළමයින් දෙමාපිය චරිත පවා අනුකරණය කරනු ලබන්නේ බන්ධුරා දක්වන න්‍යායේ ආභාසයෙනි.

# ප්‍රජානනවාදය

ඉගෙනීම සිදුවන ආකාරය පිළිබඳව ප්‍රබෝධක ප්‍රතිචාර මතයට අනුව ඉදිරිපත් කර තිබූ අදහස් කලක් ගතවීමේදී විවේචනයට ලක්විය. ඒ අනුව ඉගෙනීම සිදුවන ආකාරය පිළිබඳව නව දෘෂ්ඨී කෝණයකින් විග්‍රහ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රජානන ඉගෙනුම් න්‍යායන් බිහිවිය.

ඉගෙනීම සම්බන්ධ ක්‍රියාවලිය මීට වඩා අතිශයින්ම සංකීර්ණ බව ප්‍රජානන වාදීන් පෙන්වා දෙයි. ඔවුන් ප්‍රකාශ කරන්නේ (ප්‍රජානනවාදීන්) අලුත් යමක් ඉගෙනීමේදී ඉගෙනුම ලබන පුද්ගලයා යාන්ත්‍රික ආකාරයට ප්‍රබෝධකයන්ට ප්‍රතිචාර දක්වමින් ඉගෙනීමක් ලබනවාට වඩා ඉගෙනීමට ලක්වන දෙය (එම වස්තුව/ ඒ දෙය) පිළිබදව එම පුද්ගලයාගේ අභ්‍යන්තරීකව සිදුවන කටයුතු කීපයක්ම ඔවුහු පෙන්වා දුන්නේය.

එම අවස්ථාවේදී ඉදිරිපත් වන ප්‍රබෝධකය සංජානනය කරන (හඳුනාගන්නවා) ආකාරය, ඒ සම්බන්ධව ස්මරණය කිරීම, ඔහුගේ මතය තුළ ඒ පිළිබඳව කළ යුතු දේ පිළිබඳව කරන සංවිධානය, ඊට අදාළ තොරතුරු නැවත සකස් කිරීම, වෙනස් කර ගැනීම, යළි සකස් කර ගැනීම ආදී කාර්යයන් රැසක් සිදුවන බවයි. මෙය ප්‍රජානන ඉගෙනුම් ක්‍රියාවලිය ලෙස පැහැදිළි කර දේ.

ඒ අනුව පරිසරය හා ජීවියා අතර ඇතිවන අන්තර්ක්‍රියාවලියේදී චින්තනයෙන්, සැලසුම් නිර්මාණයෙන් තොරතුරු සකස් කිරීමේ ක්‍රියාවලියේ ඇති වැදගත්කම මෙහිදී පෙන්වා දේ. (කිසියම් දෙයක් හිතට සංජානනය {අභ්‍යන්තරීකරණය} කර ගැනීම)

මෙම ප්‍රජානන ඉගෙනුම් න්‍යායන් ඉදිරිපත්කළ මනෝවිද්‍යාඥයින් අතර **කාර්ට් කොෆ්කා, වොල්ෆ්න් කොහෙලර්, මැක්ස් වයිතමර්, කර්ට් ලෙවින්** යන අය {ගෙස්ටෝල්ටිවාදීන්} වැදගත් වේ.

ඉගෙනීම සම්බන්ධව ගෙස්ටෝල්වාදී න්‍යායක්ද ඉදිරිපත් කර ඇති **මැක්ස් වයිතමර් (1912)** දී පුදුගලයෙක් යමක් සංජානනය කර ගන්නා ආකාරය පිළිබදව අදහසක් ඉදිරිපත් කළේය. එය රූප පිටු තල සංජානනය පිළිබද අදහස මගින් ඉදිරිපත් කරන ලදී. මොවුන් පවසන්නේ කිසියම් රටාවකින් යුතුව සංජානනය කරන දේ මොළය හා ස්නායු පද්ධතිය මගින් නිරායාසයෙන්ම සංවිධානය කර සංජානනය කරනු ලබන බවයි. ගෙස්ටෝල්වාදීන් සංවිධාන නියමන් කිහිපයක් ඉදිරිපත් කරන ලදී. ඒවා නම්,

1. රූප පිටු තල සංජානනය
2. සාමූහිකරණය

ආදියයි. එසේම ප්‍රතිවේදය පහළවීම මඟින්ද ඉගෙනීම සිදුවන බව ගෙස්ටෝල්වාදී මනෝ විද්‍යඥයින් පෙන්වා දෙයි. එහිදී හදිසියේ ඇතිවූ සංජානනය නිසා ගැටලු

නිරාකරණය කර ගැනීමට හැකියාවක් ලැබෙන බව ගෙස්ටෝල්වාදීන් පැහැදිලි කරයි. උදාහරණයක් ලෙස සිම්පන්සියා කූඩුවක දමා කරන ලද පර්යේෂණයකදී මෙම ප්‍රතිවේදය පහළ වීම සම්බන්ධ අදහස ඉදිරිපත් කරන ලදී.

## මානවවාදය

මෙම මානවවාදී මතය ඉදිරිපත් කරන ලද්දේ කාල් රොජස් නැමැති අධ්‍යාපනඥයා විසිනි. 1960 දී ඔහු පලකළ ඉගෙනීමට ඇති නිදහස නැමැති කෘතියෙන් මෙම මානවවාදී මතය පැහැදිළි කරන ලදී. මීට ඉහත උගත් සෑම සියල්ලම පාහේ ඉගෙනුම් ක්‍රියාවලියේ ක්‍රම ශිලිප ගැන අවධාරණය කරයි. එහෙත් කාල් රොජස් අවධාරණය කරන්නේ ඉගෙනීම පුද්ගලයාගේ එදිනෙදා ජීවිතයේ අකණ්ඩ ක්‍රියාදාමයක් වියයුතු බවයි. තවද ඉගෙනීම සඳහා බුද්ධිය මෙන්ම චිත්තවේගද එකසේ බලපාන බවද කියයි. මානවවාදී න්‍යාය අනුව ඉගෙනීමේ අවසාන ප්‍රතිඵලය විය යුත්තේ ප්‍රජානනය හා ආවේදනය යන ක්ෂේත්‍ර දෙකෙහිම ඉහළ වර්ධනයක් විය යුතු බවයි.

කාල් රොජර් පවසන්නේ ගුරුවරයා විධාන දෙන්නෙකුට වඩා සහය වන්නෙකු විය යුතු බවයි. සිසුන්ට ඉගෙනුම් අවස්ථා සකස් කර දී එමගින් ගවේෂණයට යොමුකර ඉන් නව සාරධර්ම හා ආත්ම සංකල්ප තහවුරු කරගැනීමට ඉඩ සැලැස්විය යුතුය. එසේම ඉගෙනුම් ක්‍රියාවලියේදී ශිෂ්‍යයාගේ ලැදියා, රුචි අරුචිකම්, හැඟීම්, චිත්තවේග හා පෙළඹවීම කෙරෙහි දැඩි අවධානයක් යොමුකළ යුතු බවයි.

මානවවාදීන්ට අනුව ඉගෙනීම අර්තවත් ලෙසින් සිදු කළ යුතුය. ගැටලු වලට මුහුණ දී, ප්‍රශ්න විසදා ගැනීමටත් ඒවා ඉගෙනීමටත් ඉඩප්‍රස්ථා ලබා දිය යුතුය. ඒ ආකාරයට උචිත වූ පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් වාතාවරණයක් සකස් කරගෙන ඉගැන්වීම සිදුකළ යුතු බව කාලි රොජස් පැහැදිළි කරයි.

## ස්වනිර්මාණවාදය

මෙම වාදය ඉදිරිපත් කරන්නේ බෲනර්, විගොට්ස්කි යන විද්‍යාඥයන් ය. ඔවුන් පවසන පරිදි ස්වාධීන පරිසරය සමඟ බද්ධව ප්‍රජානන සංවර්ධනය සිදුවන බව පෙන්වා දෙයි. ඒ අනුව බෲනර් **නැමැත්තා** පවසන්නේ දරුවකු ප්‍රජානන සංවර්ධනයේදී පරිසරය ආකාර තුනකට තමාටම අභ්‍යාන්තරීකරණය නියෝජනය කර ගන්නා බවයි.

1. <u>කාර්යබද්ධ නියෝජනය</u>

මෙහිදී පරිසරය අවබෝධ කර ගැනීම චාලක ක්‍රියා ක්‍රියාකාරකම් මගින් සිදු වන බව පෙන්වා දෙයි.

2. <u>රූපික නියෝජනය</u>

මානසික රූප ගොඩ ගොඩනඟා ගනිමින් පරිසරය අවබෝධ කර ගන්නා බව පෙන්වා දෙයි. විගොට්ස්කි පවසන්නේ ප්‍රජානන සංවර්ධනයේදී මූලිකවම මැදිහත්වන්නේ භාෂා හා ක්‍රියාකාරකම් මත බවයි. මානසික ක්‍රියා ක්‍රියාවලිය සමග යට වැදගත් ක්‍රියාවලියක් ලෙස භාෂා භාවිතයෙන් ඉගෙන ගන්නා බව පෙන්වා දෙයි. මේ නිසා භාෂා හැසිරවීමේ co කුසලතාවය පරිසරය මෙන්ම සමාමාජානුයෝගී ක්‍රියාවලි තුළින් සිදුවන බව ප්‍රකාශ කරයි. එමෙන්ම පුද්ගල සංවර්ධනයේ දී භාෂාව සමාජය අතර අන්තර් ක්‍රියාකාරකම් තුළින් පෙන්නුම් කරයි. මේ අනුව ස්වනිර්මාණ වාදීන්ගේ අදහස්ට අනුව පන්ති කාමරය යහපත් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් ගොඩනඟා ගනිමින් ඉගැන්වීමට අවස්ථාවක්ව සලසා දිය යුතුය. එසේම ක්‍රියාකාරකම් පාදක සැලසුම් මනා ලෙස නිර්මාණය කිරීම මගින් යහපත් ඉගෙනුම් පරිසරයක් උදා කර ගත හැකිය.

3. <u>සංකේතාත්මක නියෝජනය</u>

භාෂාව සංගීතය වැනි සංකේතාත්මක පද්ධති මගින් පරිසරය නියෝජනය කර ගන්නා බව පෙන්වා දෙයි. වෙගොට්ස්කි පවසන්නේ ප්‍රජානන සංවර්ධනයේදී මූලිකවම මැදිහත් වෙන්නේ භාෂා හා ක්‍රියාකාරකම් මත බවයි. මානසික ක්‍රියාවලිය සමග එයට වැදගත් ක්‍රියාවලියක් ලෙස භාෂා භාවිතයෙන් ඉගෙන ගන්නා බව පෙන්වා දෙයි. මේ නිසා භාෂා හැසිරවීමේ කුසලතාවය පරිසරය මෙන්ම සමාජානුයෝගී ක්‍රියාව තුළින් සිදුවන බව ප්‍රකාශ කරයි. එමෙන්ම පුද්ගල සංවර්ධනයේ දී භාෂාව සමාජය අතර අන්තර් ක්‍රියාකාරකම් තුළින් පෙන්නුම් කරයි.

මේ අනුව සවනිර්මාණවාදීන් ගේ අදහසට අනුව පන්ති කාමරයේ යහපත් ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් ගොඩනඟා ගනිමින් ඉගැන්වීමට අවස්ථාව සලසා දිය යුතුය. එසේම ක්‍රියාකාරකම් පාදක සැලසුම්, මනා ලෙස නිර්මාණය කිරීම මගින් යහපත් ඉගෙනුම් පරිසරයක් උදාකරගත හැකිය.

<u>පැවරුම</u>

1. ඔබ ඉගෙනගත් මනෝවිද්‍යාත්මක ගුරුකුල 04 නම් කරන්න.
2. ඉන් දෙකක් පිළිබඳව අදහස් විමසීමක් කරන්න.